වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2016

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

தேசிய தொழில்முயற்சி அபிவிருத்தி அதிகாரசபை

National Enterprise Development Authority

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் வர்த்தக அமைச்சு

Ministry of Industry and Commerce

N E D A

හැදින්වීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2016 අංක 07 දරන පාර්ලිමේන්තු පනත යටතේ 2006 වර්ශයේදී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට පහසුකම් සැපයීමට මෙම ආයතනය වෙත බලය පැවරී ඇත. දේශීය ව්‍යවසායකයන් හට යටිතල පහසුකම් මූල්‍ය හා ප්‍රතිපත්ති මට්ටමේ සහයෝගය ලබා දීම සඳහා අධිකාරී පනතේ නීති මගින් බලය පවරා ඇත.

රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම අනුව කළාපීය මට්ටමේ මෙන්ම ජාතික මට්ටමේ විවිධ ක්‍රියාකාරකම් සඳහා අධිකාරිය සම්බන්ධ වී ඇත. ආයෝජන ප්‍රවර්ධනය හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ 2006 වර්ශයේ සිට 2010 වර්ශය දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ලැයිස්තුගත වී තිබුනි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 වර්ශය සිට කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතට පත්වී මේ දක්වා කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් විවිධ වැඩසටහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ආරම්භ කරන්නට යෙදුණි. එය රාජ්‍ය හා පුද්ගලික බැංකු, ව්‍යාපාරික මන්ඩල, රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා විදේශීය) ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධ වී ඇත. මෙම වැඩසටහන් වල පරමාර්ථය වී ඇත්තේ බිම් මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට මූල්‍ය සහයෝගීතාවය, පුහුණු හා උපදේශක සහයෝගීතාවය වැනි මූලික අවශ්‍යතාවයන් සැපයීම වේ. ප්‍රාදේශිය ලේඛම් කාර්යාල මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම්බන්ධීකරණය සඳහා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇත.



දැක්ම

“ජාතියේ ආර්ථික, දේශපාලනික හා සමාජ අභිලාෂයන් සපුරාලීමෙහි ලා දායකත්වය සැපයිය හැකි තරඟකාරී ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයක් ශක්තිමත් හා තිරසාර අන්දමින් ගොඩනැංවීම”

මෙහෙවර

“ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයේ ප්‍රමුඛ අංගයක් වශයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) යටතේ ඇති **ව්‍යවසායන්හි සංවර්ධනය, පැවැත්ම හා තරඟකාරීත්වය නැංවීම උදෙසා පහසුකම් සැපයීම හා සක්‍රිය අන්දමින් සහාය දැක්වීම”**

අරමුණු

- ✓ ශ්‍රී ලංකාව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය, ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමට දිරි දීම.
- ✓ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි **(NEDA)** පනතේ පරමාර්ථයන් ඉටුකිරීමෙහි ලා විදේශීය වෙළඳපොළ අවශ්‍යතා සැපිරිය හැකි දේශීය ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් බැහැරව අන්තර්ජාතික මට්ටමින් ස්ථාපිත කොට පවත්වාගෙන යාමට හැකි පරිදි සැලසුම් කිරීමට පෙළඹවීම හා ඒ සඳහා දිරිගැන්වීම.
- ✓ කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වෙළඳ හා සංවර්ධන කටයුතු ඵලදායී අන්දමින් ප්‍රවර්ධනය කිරීමට සහ සහාය වීමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්ති, සැළසුම් සහ සැළසුම්ගත ප්‍රවර්ධන දිරිදීමනා සම්පාදනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන් තාක්ෂණික කුසලතා පරිපූර්ණ මානව ප්‍රාග්ධනයක් වශයෙන් ජනතාව සවිබල ගැන්වීම.
- ✓ සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය සඳහා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.
- ✓ නිෂ්පාදන සංවර්ධනය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පේටන්ට් බලපත්‍ර වාණිජකරණය සම්බන්ධයෙන් වන පර්යේෂණ හා සංවර්ධනය ඉහල නැංවීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.
- ✓ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීම.

අධ්‍යක්ෂක මණ්ඩලය

- ඕමාර් කාමිල් මයා - සභාපති / අධ්‍යක්ෂ ජනරාල්

- අනුර බණ්ඩාර මයා - අධ්‍යක්ෂ (සැළසුම්), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- එච්. ඒ. ටි. එරන්දි මිය - සහකාර අධ්‍යක්ෂ, මුදල් හා සැළසුම් අමාත්‍යාංශය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- අන්වර් මුස්තාපා මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- සංජීව දික්වැල්ල මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- එම්.එස්.එම්. නදීර් මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- එස්. ආනන්දරාසා මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2021.11.30

ගරු විමල් වීරවංශ මැතිතුමා
කර්මාන්ත අමාත්‍ය
කර්මාන්ත අමාත්‍යාංශය
අංක 73/1,
ගාලු පාර
කොළඹ 03

ගරු අමාත්‍යතුමනී,

<u>වාර්ෂික වාර්තාව 2016</u>

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රාකාර පහත සඳහන් ලියවිලි මේ සමග ඉදිරිපත් කරමි.

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2016 වර්ශය සඳහා වූ ප්‍රගති වාර්තාව
2. 2016 දෙසැම් බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
3. විගණකාධිපති වාර්තාව

ඔබේ අවංක,

සුනිල් ජයරත්න
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්

පටුන

1.0 ව්‍යවසායකතොරතුරු බෙදාහැරීම/ සන්නිවේදනය 8

1.1 පුවත් හසුන හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අත්පොත සකස් කිරීම 8

1.2 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතිය සකස් කිරීම 8

1.3 "ව්‍යවසායක උදානය" රූපවාහිනී වැඩසටහන 9

2.0 ව්‍යාපාර සහාය සේවා ජාලය: ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන ලියාපදිංචිය හා බලපත්‍ර ලබාදීම. 9

3.0 ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව 10

4.0 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද 11

5.0 ගැටලු විසඳුම් යාන්ත්‍රණය 12

6.0 ජාතික හා ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශන 13

7.0 වෙළඳපොළ සබඳතා වැඩසටහන 14

8.0 තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය (ITTC) ස්ථාපිත කිරීම - මාකඳුර 14

9.0 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම 16

10.0 ප්‍රාදේශීය ව්‍යාපාර සංවර්ධන වැඩසටහන 16

11.0 කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 18

12.0 උපාධිධාරී ව්‍යවසායක උදානය 20

13.0 ගිණුම් වාර්ථා 22

13.1 විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය 22

13.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 23

13.2 වගකීම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 24

14.0 විගණකාධිපති වාර්තාව 25

සංවර්ධන වැඩසටහන් - 2016

1.0 ව්‍යවසායකතොරතුරු බෙදාහැරීම/ සන්නිවේදනය

1.1 පුවත් හසුන හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අත්පොත සකස් කිරීම

ජාතික ව්‍යසාය සංවර්ධන අධිකාරිය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන වෙනුවෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අත්පොතෙහි (යන්ත්‍රසූත්‍ර නිෂ්පාදකයින් පිළිබඳ තොරතුරු) මෘදු පිටපත සකස් කොට අවසන් කරන ලදි. එහි යන්ත්‍රසූත්‍ර සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු(පිටු 200ක් පමණ) ඇතුලත් වන බැවින්, සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී එය ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් වේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් මෙම අත්පොත 2017 වර්ෂයේදී ප්‍රකාශයට පත්කිරීමට සැළසුම් කොට ඇත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකයින් හා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් උදෙසා කාර්තු වශයෙන් පුවත් හසුනක් මුද්‍රණය කරනු ලැබේ. 2016 වසර සඳහා එක් පුවත් හසුනක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ප්‍රකාශයට පත්කොට ඇත. ඊට අමතරව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් sme.lk හා ye.lk යන වෙබ් අඩවි පවත්වාගෙන යන අතර, එම වෙබ් අඩවි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා බෙහෙවින් උපකාරී වේ.

1.2 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතිය සකස් කිරීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත *පද්ධතිය* පවත්වාගෙන යනු ලබන අතර, එය වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ. එහි ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තොරතුරු ඇතුලත් වේ.

1.3 "ව්‍යවසායක උදානය" රූපවාහිනී වැඩසටහන

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය උදෙසා විවිධ පියවර අනුගමන කොට ඇති අතර, එහි තවත් එක් පියවරක් වශයෙන් විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනී නාලිකා) උපයෝගී කරගනිමින් ව්‍යවසායකත්ව අධ්‍යාපන වැඩසටහනක් විකාශය කරනු ලබයි.

වැඩසටහනේ අරමුණු;

1. ව්‍යවසායකයින්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන වෙත ව්‍යාපාර තොරතුරු ලබාදීම
2. ව්‍යවසායකයින් හා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන අතර පවතින පරතරය අවම කිරීම
3. ව්‍යවසායකයින් අතර චර්යාත්මක හා ව්‍යවසාභිමුඛ සංස්කෘතියක් ගොඩනැංවීම
4. තාක්ෂණික හුවමාරුව
5. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ සේවාවන් ප්‍රවර්ධනය
6. විවිධ ක්ෂේත්‍රයන්හි ව්‍යාපාරික දැනුම වර්ධනය කිරීම
7. ව්‍යවසායකයින් විසින් මුහුණ දෙන ව්‍යාපාරික ගැටලු සඳහා විසඳුම් ලබාදීම (ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාරික ගැටලු ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත)

ව්‍යවසායකයින්ට ව්‍යාපාර තොරතුරු හා ව්‍යාපාර දැනුම ඉක්මනින් හා ඵලදායී අන්දමින් විද්‍යුත් මාධ්‍ය හරහා ලබාගත හැක. සිද්ධි අධ්‍යයන, ක්ෂේත්‍ර නිරීක්ෂණ තොරතුරු හා විද්වත් සාකච්ඡා අතරතුර අදාළ රූප රාමු ප්‍රචාරය යනාදිය ඇතුලත්ව වැඩසටහන සකස් කොට ඇත. රූපවාහිනී වැඩසටහන සතිපතා රූපවාහිනියෙන් විකාශය කෙරේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් 2016 වර්ෂයේදී වැඩසටහන් 39ක් විකාශය කොට ඇත.

2.0 ව්‍යාපාර සහාය සේවා ජාලය: ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන ලියාපදිංචිය හා බලපත්‍ර ලබාදීම.

ව්‍යාපාර සහාය සේවා, උසස් තත්ත්වයේ පාරිභෝගික සේවා උපදෙස් ලබාදීම, මග පෙන්වීම, සහාය වීම සහ පුහුණුව ලබාදීම යනාදී සේවාවන් සැපයීම හරහා දේශීය ප්‍රජාව සමග කටයුතු කළයුතු අතර, එහිදී රැකියා විරහිත පිරිස් සඳහා පමණක් නොව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රජාව වෙනුවෙන්ද එම සේවාවන් සැපයිය යුතුවේ. මෙකී සේවාවන්, තනි පුද්ගල උපදේශක සේවා මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා ආයතන(BDS) මගින්ද සපයනු ලැබේ. ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර ආරම්භය, පුළුල් කිරීම, මූල්‍ය පහසුකම්, අධ්‍යාපනය හෝ පුහුණු මෙන්ම අනෙකුත් ව්‍යාපාර සහාය සේවා ලබාගැනීම සඳහා සහයෝගය අවශ්‍ය වේ. එනමුත්, ව්‍යවසායකයින් සඳහා එවැනි සේවාවන් සැපයීමේ විධිමත්

යාන්ත්‍රණයක් නොමැති අතර, ව්‍යවසායකයින් හා ව්‍යාපාර සේවා සපයන්නන් අතර විධිමත් සබඳතා ජාලයක් ද නොපවතී. ඊට අමතරව, සමහර ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවලට ගුණාත්මක සේවාවක් සැපයීමේ ධාරිතාව අඩු මට්ටමක පවතී. එබැවින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් එකී ආයතනවල හැකියාවන් වර්ධනය තුළින් ගුණාත්මක සේවාවක් සැපයීමේ මට්ටම වර්ධනය කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

2016 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන පහත දක්වා ඇති පරිදි ලැයිස්තුගත කර ඇත. අදාළ තොරතුරු පුවත්පත් දැන්වීම් හා සංවර්ධන නිලධාරීන් මගින් රැස්කර ගන්නා ලදි.

ව්‍යාපාර සංවර්ධන සේවා වර්ගය	ලියාපදිංචි සංඛ්‍යාව
පුහුණුකරු / උපදේශක- ව්‍යවසායකත්ව	25
පුහුණුකරු / උපදේශක- තාක්ෂණික	64
යන්ත්‍රසූත්‍ර නිෂ්පාදක	110
පෞද්ගලික බැංකු	17
සමසේවා සැපයුම් ආයතන	50
රාජ්‍ය බැංකු	34
රාජ්‍ය නොවන සංවිධාන/අර්ධ රාජ්‍ය ආයතන	39

වගුව 1 : ලියාපදිංචි ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන

3.0 ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ප්‍රශස්ත අන්දමින් දායකත්වය සපයා ඇති ව්‍යාපාර හඳුනා ගැනීම, ඇගයීම හා දිරිමත් කිරීම යන අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් මෙම ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පවත්වනු ලබයි. ඒ යටතේ පළාත් හතරක (සබරගමුව, උතුරුමැද, බස්නාහිර සහ මධ්‍යම) සම්මාන ප්‍රදානෝත්සව හතරක් දිස්ත්‍රික් කාර්යාල/රාජ්‍ය ආයතනවල සහයෝගීත්වයෙන් පවත්වන ලදි. තව ද, උතුරු හා නැගෙනහිර පළාත්වල තවත් සම්මාන ප්‍රදානෝත්සව දෙකක් පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතින අතර එය *20*17 වර්ෂයේදි සම්පූර්ණ කිරීමට හැකිවනු ඇත.

මෙම සම්මාන ප්‍රදානයේ පරමාර්ථ වනුයේ:

- ප්‍රාදේශීය වශයෙන් කැපීපෙනෙන ව්‍යවසායකයින්ට පිළිගැනීමක් ලබාදීම හා සම්මානයට පාත්‍ර කිරීම
- පළාතේ ආර්ථික සංවර්ධනයට තම දායකත්වය වැඩි වශයෙන් ලබාදීමට ව්‍යවසායකයින් උනන්දු කිරීම හා දිරිගැන්වීම.





පින්තූරය 1 : සේවා ගිවිසුමක් අත්සන් කිරීම

4.0 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ (ප්‍රා/ලේ) මට්ටමින් ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවාවන් සැපයීමේ විධිමත් යාන්ත්‍රණයක් සැකසීමේ අරමුණෙන් දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවා ඇත. මෙකී සංසද දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන, වාණිජ මණ්ඩල සහ වෙළඳ හෝ ව්‍යාපාර සංගම්වලින් සමන්විත වේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවීමට සැලසුම්කොට ඇත.

දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යසායකත්ව සංසද අරමුණු:

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන අතර සබඳතා ගොඩනැංවීම
- රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර සංවාද සඳහා පහසුකම් සැපයීම

- දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංගම් අතර මනා සම්බන්ධීකරණයක් ඇතිකිරීම
- දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද හරහා ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම
- ප්‍රාදේශීය මට්ටමේ සංසද මගින් ව්‍යාපාර ගැටලු රැස්කොට ඒවා ජාතික මට්ටමේ සංසදය වෙත යොමුකිරීම හා එකී ගැටලු සඳහා විසඳුම් සෙවීමට කටයුතු කිරීම

2016 වසර දක්වා, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද 14ක් සහ ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද 88ක් ස්ථාපිත කොට ඇත.





පින්තූරය 2 : ප්‍රාදේශීය ව්‍යාපාර සංසද

5.0 ගැටලු විසඳුම් යාන්ත්‍රණය

ගැටලු විසඳුම් මෘදුකාංගය යනු සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු සොයාගැනීමට භාවිතා කරන යෙදවුමකි. එමගින් සොයාගන්නා ගැටලු විසඳුම් ලබාදීම සඳහා අදාල ආයතන වෙත යොමුකරනු ලැබේ. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් මෙම ගැටලු සෙවුම් පද්ධතිය ක්‍රියාකරවීම සඳහා පමණක් වෙන් වූ දෘඩාංගයක් (server) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ස්ථාපිත කොට ඇත.

6.0 ජාතික හා ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශන

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ක්ෂේත්‍රය ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනය කිරීම කර්මාන්ත ප්‍රදර්ශන පැවැත්වීමේ යෝජනාව තුළින් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපාර සංවර්ධන සේවා ප්‍රදර්ශන පැවැත්වීමේ ප්‍රධාන අරමුණු වනුයේ ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම් ආයතන හා මධ්‍ය හා සුළු පරිමාණයේ ව්‍යාපාරිකයින් අතර පවතින පරතරය අවම කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය සඳහා ව්‍යාපාරික ජාලයක් ස්ථාපිත කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ප්‍රාදේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා වෙළඳපොළ සබඳතා ගොඩනැංවීමයි.

2016 වර්ෂයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් කුරුණෑගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි කර්මාන්ත ප්‍රදර්ශන දෙකක් පවත්වා ඇත. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ කර්මාන්ත ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැළසුම් කරන ලදි. එම ප්‍රදර්ශනය නොපැවැත්වූ නමුත්, අම්පාර දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රදර්ශනය යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් 270 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදෙන ලදි.









පින්තූරය 3 : කර්මාන්ත ප්‍රදර්ශනය- කුරුණෑගල

7.0 වෙළඳපොළ සබඳතා වැඩසටහන

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සැපයුම්කරුවන් වශයෙන් ස්ථාවර වීමේ පහසුකම් සැපයීම උදෙසා ඔවුන් සැපයුම් කරුවන් වශයෙන් සුපිරි වෙළඳසැල් ජාලයට හඳුන්වා දීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම් කරන ලදි. ඒ අනුව, සංවර්ධන නිලධාරීන් හරහා හැකියාවන් සහිත සැපයුම්කරුවන් හඳුනාගැනීමට හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා ධාරිතාවයන් තක්සේරු කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබේ. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහල නැංවීමට හා මූල්‍ය පහසුකම් ලබාගැනීමට ද සහාය දක්වයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, කුරුණෑගල, අනුරාධපුර, අම්පාර සහ මහනුවර දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් 155 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු පාඨමාලා හතරක් පවත්වා ඇති අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 28 දෙනෙකුට මූල්‍ය ප්‍රතිපාදන සපයා ඇත.





පින්තූරය 4 : ඇසුරුම්කරණ පුහුණුව - කුරුණෑගල

8.0 තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය (ITTC) ස්ථාපිත කිරීම - මාකඳුර

තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය යනු වෘත්තීයමය තාක්ෂණික සහාය ලබාදීම මගින් නව නිපැයුමක් හෝ සේවාවක් ආරම්භ කිරීමේ මූලික ප්‍රාග්ධනය අඩු කොට දැරීමට සිදුවන අවදානම අවම කළහැකි සේවා ස්ථානයකි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රදේශයේ පවතින ක්ෂුද්‍ර මූල්‍ය හා කුඩා කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිමකළ උපාධිධාරීන් ස්වඋත්සාහයෙන් නැගී සිටීමට හැකියාව ලබාගන්නා තෙක්, ඔවුන්ට නව ව්‍යාපාර ආරම්භනය සඳහා පහසුකම් සැපයීමයි.

විශ්ව විද්‍යාල සහ පර්යේෂණ හා සංවර්ධන ආයතන මගින් නව තාක්ෂණය සහ නව නිශ්පාදන එළිදක්වන නමුත්, එවන් බොහෝ නිපැයුම් ව්‍යවසායකත්ව මට්ටමේ නොපවතින බැවින් හෝ එකී නව නිපැයුම් අත්හදා බැලීමට කැමැත්තක් දක්වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතට පත් නොවන බැවින්, පර්යේෂණ මට්ටමේ පවතී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙළඳපොළ අස්ථාවරත්වය මත ඇතිවන අවදානම හේතුවෙන් නව නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීමට මැලිකමක් දක්වයි. එවන් නිෂ්පාදන සඳහා නව යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය වන අතර, එවන් යන්ත්‍ර සූත්‍ර සඳහා යෙදවිය යුතු ආයෝජන ප්‍රමාණය, තම ව්‍යාපාරය මූලික අදියරේ පවත්වාගෙන යන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට දැරිය හැකි ප්‍රමාණය ඉක්මවා යයි.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය **(WUSL)** සහ ඒ හා ආශ්‍රිත පර්යේෂණ ආයතන මගින් සිදුකරන පර්යේෂණ හා සංවර්ධන ආයතන මගින් සොයාගනු ලබන නව්‍ය ව්‍යාපාරික අදහස් (නව සොයාගැනීම්) අනුව නව ව්‍යාපාර ඇරඹීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් සිදුකරන ආයෝජන සඳහා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය (ITTC) පහසුකම් සැපයෙනු ඇත. ඒ අනුව, එකී පර්යේෂණ ආයතන (WUSL) හා ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර සහසම්බන්ධතාවයක් ගොඩනැංවීමට තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය අවස්ථාව සලසයි. තව ද, විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය මගින් සපයන පහසුකම් විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් තවදුරටත් විකසනය කරලීම සඳහා භාවිතා කිරීමේ ඉඩකඩ සැළසීම මගින්, ඔවුන් ව්‍යවසායකයින් ලෙස ඉදිරියට යාමට දිරිමත් කෙරේ. ඊට අමතරව, පර්යේෂණ නිලධාරීන් සහ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හා එක්වූ විට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් මුහුන පාන ගැටලු පහසුවෙන් හඳුනා ගැනීමේ ඉඩකඩ විවර වන අතර, එය ඔවුන්ගේ පර්යේෂණ ගැටලු නිරාකරණය උදෙසා ඵලදායී ලෙස යොදාගත හැකිවේ.

ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් අපේක්ෂා කරන පහසුකම් හා සේවාවන් කාර්යක්ෂම අන්දමින් සැපයීම උදෙසා විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය හැසිරවිය යුතු ආකාරය සම්බන්ධයෙන් වයඹ විශ්වවිද්‍යාලය හා සහසම්බන්ධව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලදි. එකී අධ්‍යයනයේ ප්‍රතිඵලයක් වශයෙන් විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය මගින් නියෝජනය වියයුතු ව්‍යාපාරික ක්ෂේත්‍ර ඇතුලත් ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා වයඹ විශ්ව විද්‍යාලය, විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයේ ස්ථාපනය, කළමනාකරණය හා මෙහෙයුම් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට

එළැඹෙන ලදි. විකාශන හා තාක්ෂණික භුවමාරු මධ්‍යස්ථානය සමාගම් ලියාපදිංචි කිරීමේ ආයතනයේ ලියාපදිංචි සමාගමක් වනු ඇති අතර, කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වනු ඇත.

2016 වර්ෂයේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් එහි ඉදිකිරීම් කටයුතු හා යන්ත්‍ර සූත්‍ර සවිකිරීමේ කටයුතු 90%ක් නිමකර ඇත.

9.0 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහයෝගීතාවයෙන් යුතුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදි. (ව්‍යවසායකයින් 35 දෙනෙකු සඳහා)

10.0 ප්‍රාදේශීය ව්‍යාපාර සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් ප්‍රාදේශීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ඉටුකරනු ලැබේ. එසේ වුව ද, ඔවුන්ගේ ව්‍යවසායකත්ව දැනුම, අළෙවිකරණ, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණ දැනුම යනාදිය ප්‍රමාණවත් මට්ටමක නොමැති බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් හඳුනා ගන්නා ලදි. එසේම, ඔවුන්ට තම ව්‍යාපාර ආරම්භ කිරීමට /පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් සේවයේ නියුක්තව සිටින අතර, ඔවුන් විසින් ඉහත කී දැනුම හා කුසලතා වර්ධනය කරලීමට අවශ්‍ය ව්‍යවසායකයින් හඳුනාගනු ලැබේ.

එබැවින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් සඳහා කෙටි කාලීන පුහුනු වැඩසටහන් හා පසු විපරම් සේවා පැවැත්වීමට සැළසුම් සකස් කොට ඇත.

2016 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පහත දක්වා ඇති පරිදි (තාක්ෂණික සහ ව්‍යවසායකත්ව සංවර්ධන) පුහුනු වැඩසටහන් පවත්වා ඇත.

නිමැවුම්:

1. තෝරාගත් නවක හා ක්ෂේත්‍රයේ සිටින ව්‍යවසායකයින් ඔවුන්ගේ අව්‍යශතා මත පදනම් ව පුහුනු කිරීම (උදා. ව්‍යවසායකත්ව, තාක්ෂණික, අළෙවිකරණ, වාර්තා තබාගැනීම යනා දී..)

2. පසු විපරම් සේවා හා ව්‍යාපාර උපදේශන සැපයීම.

2016 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකයින් 11,523ක් පුහුණු කරන ලදි.

දිස්ත්‍රික්කය	පුහුනු වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
අනුරාධපුර	21	380
පොළොන්නරුව	1	52
බදුල්ල	23	393
කළුතර	7	88
හම්බන්තොට	27	839
මාතර	71	1904
කෑගල්ල	23	537
පුත්තලම	49	1609
රත්නපුර	22	465
කුරුණෑගල	72	1119
කොළඹ	2	5
මාතලේ	11	232
මොණරාගල	7	360
අම්පාර	13	405
මඩකළපුව	7	145
යාපනය	11	355
කිළිනොච්චිය	3	110
වවුනියා	3	5
ත්‍රිකුණාමලය	5	215
මුලතිවු	01	30
ගම්පහ	42	856
ගාල්ල	41	1392
නුවරඑළිය	8	27
එකතුව	**469**	**11523**

වගුව 2 : ප්‍රාදේශීය පුහුනු වැඩසටහන්





පින්තූරය 5 : පුහුනු වැඩසටහන්- කුරුණෑගල

11.0 කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලාංකික කාන්තාව මේ වනවිට මෙරට ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී භූමිකාවක් නිරූපණය කරයි. එමෙන්ම ඔවුන් ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පුරුෂ පක්ෂය හා සම තත්ත්වයට පත්වීම සඳහා තරඟයක් ලබාදෙන තත්ත්වයක් ද පෙන්නුම් කරයි. එනමුත් සැලකිය යුතු කාන්තා ව්‍යවසායකයින් පිරිසක් තවමත් සාපේක්ෂව පසුගාමී තත්ත්වයක පසුවෙයි. කෙසේ වුව ද, මේ වනවිට තත්ත්වය වෙනස්වීමකට භාජනය වී ඇති අතර, මෙරට ආර්ථික ක්‍රියාදාමයට ශ්‍රී ලාංකික කාන්තාව විශිෂ්ට දායකත්වයක් ලබාදෙන බවට සාක්ෂි බොහොමයක් පවතී. පසුගිය දශක කිහිපයක කාලය තුළ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පිරිමි ව්‍යාවසායකයින් අභිබවමින් සැලකිය යුතු ප්‍රගතියක් ඔවුන් විසින් අත්පත් කරගෙන ඇත. කාන්තාවන් විශාල පිරිසක් තමාගේම ව්‍යාපාර ආරම්භ කරන ලද අතර, ඒ අතරින් බොහොමයක් සාර්ථකත්වයට පත්ව ඇත. එනමුත්, ව්‍යවසායකත්වය, අළෙවිකරණය, තාක්ෂණික සහ මූල්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ඔවුන්ට ඇත්තේ අල්ප දැනුමකි. තව ද, ඔවුන් තම ව්‍යාපාර ආරම්භයට/ පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් නොමැති වීමේ බාධකයට මුහුන පා සිටී.

එබැවින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සියළුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමින් කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් කාන්තා ව්‍යවසායකයින් 10935ක් සඳහා පුහුනු වැඩසටහන් පවත්වා ඇත.

දිස්ත්‍රික්කය	පුහුනු වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
අනුරාධපුර	22	380
පොළොන්නරුව	1	30
බදුල්ල	8	146
කළුතර	25	189
හම්බන්තොට	22	580
මාතර	52	1317
මහනුවර	26	910
කෑගල්ල	30	665
පුත්තලම	55	1492
රත්නපුර	19	645
කුරුණෑගල	74	960
කොළඹ	2	30
මාතලේ	13	580
මොණරාගල	9	210
අම්පාර	18	560
මඩකළපුව	10	254
යාපනය	20	345
කිළිනොච්චිය	4	71
වවුනියාව	7	480
ත්‍රිකුණාමලය	2	105
මුලතිවු	2	60
ගම්පහ	3	86
ගාල්ල	41	810
නුවරඑළිය	1	30
එකතුව	**466**	**10935**

වගුව 3 : කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්





පින්තූරය 6 : තාක්ෂණික පුහුණු වැඩසටහන්- පුත්තලම

12.0 උපාධිධාරී ව්‍යවසායක උදානය

මෙරට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් සහිතව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර සංවර්ධනය කිරීමෙහිලා ප්‍රවර්ධනය, සහාය දැක්වීම, දිරිමත් කිරීම හා පහසුකම් සැපයීම සිදුකරනු ලබයි. ඒ යටතේ ව්‍යවසායකයින්ට හා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවලට ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, මූල්‍ය පහසුකම්, වෙළඳපොළ සබඳතා, පර්යේෂණ හා සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය යනාදී සේවාවන් සපයනු ලබයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල සමග එක්ව උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ආකර්ශනය කරලීමේ මෙම වැඩසටහන **“උපාධිධාරී ව්‍යවසායක උදානය”** යනුවෙන් නම්කොට ඇත.

වැඩසටහනේ අරමුණ: උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ටවීම දිරිමත් කිරීම හා ඔවුන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත්කිරීම

ක්‍රියාත්මක කිරීම : ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය(NEDA) සහ විශ්ව විද්‍යාල CGU

ඉලක්කගත කණ්ඩායම: ව්‍යාපාරික ක්ෂේත්‍රයට ඇල්මක් දක්වන විශ්ව විද්‍යාලවල අවසන් වසරේ විද්‍යාර්ථීන්

වැඩසටහන මගින් සැපයෙන් පහසුකම්:

- ධාරිතා සංවර්ධන වැඩසටහන් (ව්‍යවසායකත්ව සංවර්ධන, ව්‍යාපාර කළමනාකරණය සහ අළෙවිකරණය යනාදී..)
- තාක්ෂණික හුවමාරුව (අවශ්‍යතා මත පදනම්ව)

- වෙළඳපොළ සබඳතා
- ව්‍යාපාර ආරම්භයට/පුළුල් කිරීමට මූල්‍ය පහසුකම්
- නිරීක්ෂණ සංචාර
- ව්‍යාපාර උපදේශන සේවා සහ පසු විපරම් සේවා

වයඹ, පේරාදෙණිය සහ රුහුනු විශ්ව විද්‍යාලවල උපාධිධාරීන් 168 දෙනෙකු සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

13.0 ගිණුම් වාර්ථා

13.1 විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2016 රු.	2015 රු.
වැඩසටහන් සඳහා ලද ප්‍රතිපාදන හා වියදම			
වර්ෂය සඳහා සක්‍රිය වෙන්කිරීම්	16	31,614,270	15,079,892
වැඩසටහන් සඳහා වියදම්	9	31,614,270	15,079,892
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය/(හිඟය)		-	-
මෙහෙයුම්			
මහ භාණ්ඩාගාර පුනරාවර්තන වෙන්කිරීම්		19,202,159	19,055,872
රාජ්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම්	14	5,631,434	5,438,072
වෙනත් ආදායම්	7	18,548,872	252,102
ආදායම් එකතුව		**43,32,465**	**24,746,046**
පරිපාලන වියදම්	8	25,333,872	24,746,046
වෙනත් ව්‍යාපෘති සඳහා වියදම්	9	44,000	-
වියදම් එකතුව		**25,377,872**	**25,359,441**
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය/(හිඟය)		**18,004,593**	**(613,396)**

13.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2016 රු.	2015 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	11,988,452	14,690,973
ජංගම වත්කම්			
ලැබීම්	11	-	-
තැන්පතු හා අත්තිකාරම්	12	30,890,400	2,703,648
පෙර ගෙවුම් වියදම්	13	83,187	49,371
උත්සව අත්තිකාරම්		10,000	11,250
මුදල් හා මුදල් සමාන		18,498,850	593,251
ජංගම වත්කම් එකතුව		**49,482,436**	**3,357,519**
වැඩ ප්‍රගතිය සි/ස ගී එන්ස්ප්‍රස් සමාගම		**18,387,668**	-
ඉතිරිකිරීමේ ගිණුම් - පාරිභෝගික		**521,567**	-
වෙනත් ජංගම වත්කම් එකතුව		**18,909,235**	-
වත්කම් එකතුව		**80,380,125**	**18,048,492**
නිමිකම් සහ වගකීම්			
නිමිකම්			
සමුච්චිත අතිරික්තය		18,564,910	2,132,443
නිමිකම් එකතුව		**18,564,910**	**2,132,443**
ජංගම නොවන වගකීම්			
රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම්	14	9,225,134	12,503,095
විශ්‍රාම ප්‍රතිලාභ	15	521,567	415,824
ජංගම නොවන වගකීම් එකතුව		**9,746,701**	**12,918,919**
ජංගම වගකීම්			
වැඩසටහන් සඳහා වෙන්කිරීම්	16	34,650,594	822,387
උපචිත වියදම්	17	1,479,581	2,174,746
කොන්ත්‍රාත් වගකීම්	18	4,326,007	-
අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය	19	11,612,332	-
ජංගම වගකීම් එකතුව		**52,068,514**	**2,997,133**
වගකීම් සහ වත්කම් එකතුව		**80,380,125**	**18,048,492**

13.2 වගකීම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

2016 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වගකීම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

	සමුච්චිත අතිරික්තය රු.	එකතුව රු.
2015 ජනවාරි 01 දිනට ශේෂය	3,705,071	3,705,071
වර්ෂය සඳහා මුළු හිඟය	(613,396)	(613,396)
2014 වර්ෂය සඳහා ගැලපුම්	(959,232)	(959,232)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,132,443**	**2,132,443**
වර්ෂය සඳහා මුළු හිඟය	18,004,593	19,004,593
2015 වර්ෂය සඳහා ගැලපුම්	(1,572,126)	(1,572,126)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**18,564,910**	**18,564,910**

සටහන

ව්‍යාපෘති වියදම් භාවිතයට ගැනීම පිළිබඳ සටහන් නොගැලපීම් හේතුවෙන් පෙර වර්ෂයට අදාළව ලාභ හා පාඩු පිළිබඳ ප්‍රකාශනයේ නැවත සටහන් යොදමින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනයේ පියවා නොමැති අත්තිකාරම් පිළිබඳ තොරතුරු නැවත ගලපා ඇත.

14.0 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/සී/එන්ඊඩීඒ/ එෆ්ඒ /2016 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ඔක්තෝබර් 04 දින

සභාපති,

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2019 ජූලි 23 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාඟණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

ශ්‍රී.ල.ගි.ප්‍ර 16 :- දේපල පිරියත හා උපකරණ

වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම ශ්‍රී.ල.ගි.ප්‍ර. 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2016 දෙසැම්බර් 31 දිනට ලියාභල අගය රු. 11,988, 452 ක් වූ දැනට භාවිතා කරමින් පවතින යන්ත්‍රෝපකරණ, මෝටර් රථ, කාර්යාල උපකරණ, ලීබඩු හා සවිකිරීම්, පුස්තකාල පොත්, ගිණුම් මෘදුකාංග සහ පරිගණක හා පරිගණක උපාංග වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ සටහන් කිරීමේදී රු. 593, 251 ක් වූ මුදල් ශේෂය මුදල් පොතට සටහන් කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල් ශේෂය හා මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලීඛඩු උපකරණ ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු. 3,772,538 ක් වුවද එම වටිනාකම රු. 3,603,679 ක් වශයෙන් රු 168,859 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු.14,750 ක් වූ පරිගණක යන්ත්‍රය වෙනුවෙන් රු.3,072 ක් ක්ෂය වෙන් කර නොතිබීම හේතුවෙන් ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ සහ ක්ෂය ගිණුමේ ශේෂය රු.3,072 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) කුලී ගෙධනැගිල්ලක පවත්වාගෙන යනු ලැබූ අධිකාරියේ කාර්යාල පරිශ්‍රයේ සිදුකරන ලද නවත්තු හා අළුත්වැඩියාවන් සඳහා 2014 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ දරන ලද පිළිවෙලින් රු.1,280,282 ක් හා රු. 56,250 ක් වූ වියදම් නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත නොකර යන්ත්‍ර සූත්‍ර ලෙස ප්‍රාග්ධනීත කර තිබුණු අතර ඊට අදාලව රු390,412 ක් ක්ෂය වෙන් කර තිබුණි එම නිසා වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් වල ධාරණ අගය රු. 946,120 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) විගණනය විසින් පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ආයතනය විසින් ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

	ආයතනය විසින් ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව	විගණනය විසින් පිළියල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව	වෙනස
	රු.	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්	7,085,721	(27,013,373)	34,099,094
මූලා ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්	31,561,019	66,181,680	34,620,661
වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වල වෙනස් වීම්	17,905,599	18,427,166	521,567

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියල කිරීමේදී වර්ෂයේ ශුද්ධ අතිරික්තයට ඉකුත් වර්ෂයට අදාල ගැලපීම් රු. 1,572,126 ක් හා ක්ෂය අයි වෙන්කිරීම් රු. 575,440 ක් ගලපා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් සඳහා වන වගකීම් වැඩිවීම රු. 4,326,007 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.15,938,339 කින් අඩුවීමක් ලෙස දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ Incubator project සඳහා ලද ප්‍රදානයෙන් ක්‍රමක්ෂය රු.18,387,668 ක මුදල අතිරික්තයට ගලපා නොතිබුණි.

(v) වැඩසටහන් සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් මූලා ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද එහි ශුද්ධ වටිනාකම කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(vi) පාරිතෝෂික ගෙවීම් සඳහා ආරම්භ කරන ලද ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය රු. 521 ,567 මුදල් හා මුදල් සමාන දෑ වල හෝ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හෝ සටහන් කර නොතිබුණි.

2.2.3 නොසැසඳුනු සාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයන් මුදල් පොතේ ශේෂය සමඟ සැසඳී නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 18,004,593 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 613,396 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.18,617,989 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලද ප්‍රදානයට අදාල ක්‍රමක්ෂය රු. 18,387,668 ක් වර්ෂයේ ලාභයට ලියාහැරීම ඉහත අතිරික්තය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 21 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

ඩබ්ලිව්. ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති